**වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.07.31**

**පිළිගැනීම**

2025 වර්ෂයේ ජූලි මස 31 වන බ්‍රහස්ප්‍රතින්දා දින පෙ.ව.09.00 ට මූලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදි මහතුන් ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රසීක් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දිනිෂා මැතිණිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණි දිසානායක මැතිණිය
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසිප් මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා

40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිණිය
42. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය
43. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

**නොපැමිණි**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා

**01. පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම .**

ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන ඇත්නම් ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව පහත ආකාරයෙන් සංශෝධනය සටහන් කරන ලදි.

**I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගිය සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 06 යටතේ සඳහන්වන කාරණයට අදාළව වැලිමඩ ප්‍රාදේශීය සභාව විදිහට අපේ නිර්දේශය ලබා නොදිය යුතු බවට මා කළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා විසින් ස්ථිර කළා. සභාවට ඉදිරිපත් කරන ලද එම යෝජනාව යෝජනාවක් ලෙස හා ස්ථිර කිරීම පිලිබඳව වාර්තාවේ සටහන් වී නොමැත.එසේම , 6 වෙනි පිටුවේ මේ වාර්තාවට අදාළව සභා තීරණය නුවරඑළිය ජලසම්පාදන මණ්ඩලයට ලිඛිතව ලබාදිය යුතු බව සඳහන් නොවන අතර 21 වන පිටුවේ ද අංක 3 යටතේ මා කල යෝජනාව ගරු මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා විසින් ස්ථිර කළා.එම ස්ථිර කිරීමද අදාළ වාර්තාවේ සඳහන් වී නොමැත.එබැවින්, එම කරුණු සංශෝධනයන් ලෙස සටහන් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පිටු අංක 20 හි යෝජනා අංක 01 ට අදාල ඡන්ද විස්තරය ඉදිරිපත් කරලා තියෙනවා .නමුත් නම් වශයෙන් ඡන්දය භාවිතා කළ ආකාරය සඳහන් වි නොමැත.එය සංශෝධනය විය යුතු බව මා කියා සිටින අතර එම ලේඛණය අත්‍යවශ්‍ය බැවින්,සභාව කල්දමා මෙම අවස්ථාවේ දිම ලබාදිමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,සභා වාර්තාවේ වැලිමඩ ප්‍රාදේශිය සභාවට අයත් සුසාන භූමි සංඛ්‍යාව පිළිබඳව සටහන් කර ඇති නමුත්,දැනට වසර 15 0කට වඩා කාලයක් පැරණි බෝගහකුඹුර මුස්ලිම් සුසාන භූමිය කිහිප සැරයක් ලියාපදිංචි කිරිමට කටයුතු සිදු කලද තවමත් එය සුසාන භූමි ලේඛණයට ඇතුලත් කර නොමැත.

**ගරු සභාපති අජිත් කුමාර දිසානායක මැතිතුමා**

තුවාන් කාසිම් මන්ත්‍රීතුමනි ,මහා සභා වාර්තාවට අදාළ සංශෝධන තියෙනවානම් පමණක් ඉදිරිපත් කරන ලෙස හා පසුව වෙනත් කාරණා ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එසේ යෝජනා අංක 01 ට අදාල ඡන්ද විස්තරය ඇතුළත් ලේඛණය මේ අවස්ථාවේදි ලබා දෙනවා.

**IV. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දෙමළ සභා වාර්තාවේ පිටු අංක 21 යටතේ මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමේදී තුවාන් කාසිම් මන්ත්‍රීතුමා බෝගහකුඹුර නගරයේ පරිසර ගැටළු පිළිබඳව අදහස් දැක්වීම සඳහන් කර ඇති නමුත් බෝගහකුඹුර නගරයේ ශ්‍රමදාන පිළිබඳව අපේ පක්ෂය වෙනුවෙන් මාද ඒ සම්බන්ධව කතා කලා.නමුත් එය වාර්තාවේ සඳහන්වී නොමැති අතර සංශෝධන ලෙස සටහන් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**V. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය**

ගරු සභාපතිතුමනි, පිටු අංක 25 යටතේ මා සඳහන් කලේ ධයරබා ඉහල කොටස ලෙසයි.නමුත් වාර්තාවේ ධයරබා පහළ කොටස ලෙස සඳහන් වේ.එය සංශෝධන ලෙස සටහන් කරන ලෙස මා ඉල්ලා සිටී.

**VI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා**

ගරු සභාපතිතුමනි,චිත්‍රා පතිරණ මන්ත්‍රීතුමිය සභා වර්තාවේ පිටු 25ක් ගැන කතා කලත් අපිට ලැබී තියෙන දෙමළ සභා වාර්තාවේ පිටු 22ක් පමණක් තිබෙන බැවින් ඒ පිළිබඳ පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර දිසානායක මැතිතුමා**

සිංහල මාධ්‍ය වාර්තාවේ පිටු 25ක් ඇති අතර දෙමළ මාධ්‍ය වාර්තාවේ පිටු 22ක් තිබේ.නමුත් එහි අන්තර්ගතය එලෙසටම අඩංගු වි තියෙනවා.ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනවා.

ඒ අනුව ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව 2025.06.26 වනදින මහා සභා රැස්වීම් වාර්තාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රසේකර මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුගේ යෝජනා** ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** තාහිර් මහරූෆ් මැතිතුමා පෙ.ව 09.16ට සභාවට පැමිණෙන ලදි.

**2. ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන,**

- අලුතින් පත් වු ගරු මන්ත්‍රීවරුන් පත් වි මසත් ඉක්මයාමට පෙර වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදෙන ලෙසත්,අදාළ අකෘති සභාවෙන් ලබා දෙන බවත්,මා නිවේදනය කර සිටිනවා.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන සන්දේශ/පැමිණිලි/පෙත්සම්/සන්නිවේදන ලිපි -නැත**

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික රන්දෙණිය මැතිතුමා විසින් ගෙන එන ලද ප්‍රශ්නාවලිය**

1. **වැලිමඩ ප්‍රාදේශීය සභාව සතු සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය කොපමණද?**
2. **මිනුම් කටයුතු සිදු කර නිරවුල් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද?**
3. **නිරවුල් නොවූ ඉඩම් ප්‍රමාණය කොපමණද?**
    - **එම ඉඩම් නිරවුල් නොවීමට හේතු මොනවාද?**
    - **එම ඉඩම් වල පිහිටීම හා ප්‍රමාණයන් කොපමණද?**
4. **නිරවුල් ඉඩම් වලින් ප්‍රයෝජන සඳහා යොදා නොගත් ඉඩම් මොනවාද?**

**01 එම ප්‍රශ්නාවලියෙන් ඉදිරිපත් කර ඇති 01 වන ප්‍රශ්නය -**

සභාව සතු සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය - 54 කි.

( දැනට නිරවුල් ලෙස හදුනා ගත් තාවකාලික තක්සේරුවක් මත ස්ථාවර වත්කම් ලේඛනයට ද ඇතුලත් කර ඇත.)

**02. මැනුම් කටයුතු සිදු කර නිරවුල් කර ඇති ඉඩම් ප්‍රමාණය** -12 කි.

**03. නිරවුල් නොවූ ඉඩම් ප්‍රමාණය -** -42 කි.

( දැනට පැවරුම් නියෝග හා පිඹුරුපත් නොමැති ඉඩම් සඳහා ඒවා ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත.)

***එම ඉඩම් වල පිහිටීම හා ප්‍රමාණයන්**

එම ප්‍රශ්න සඳහා පිළිතුරු ඇමුණුම 01 ලේඛනයෙන් ඉදිරිපත් කර ඇත.

**04. නිරවුල් ඉඩම් වලින් ප්‍රයෝජනය සඳහා යොදා නොගත් ඉඩම් ප්‍රමාණය -** මේ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව ලබන සභා වාරයේ දී තොරතුරු ලබා දෙන බව කාරුණිකව දන්වා සිටිමි.

<u>**වැලිමඩ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් ලේඛනය**</u>

| අ. අ. | වත්කම වර්ගය | ස්ථානය | භූමිය වෙන් කර ඇත්තේ කුමක් සඳහාද | වර්තමානයේ භූමිය භාවිතා කරන්නේ කුමක් සඳහා ද | පැවරුම් නියෝග: පැවරුම් නියෝගයක් ඇත/නැත | පැවරුම් නියෝග: පැවරුම් නියෝගයක් ඇත් නම් එහි අංකය | අවසාන ගම සිතියම අංකය | කැබලි අංකය | රේඛා සටහන් අංකය | පිඹුරු අංකය | ඔප්පු අංකය | ප්‍රමාණය: අක් | ප්‍රමාණය: රූඩ් | ප්‍රමාණය: පර් | ප්‍රමාණය: මුළු පර්. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | සිල්පරා වේ හේන ඉඩම | බදුල්ල පාර | කණු පද්ධතියක් සහ සෝගාත කාගාරයක් සඳහා | මළ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය | ඇත | 118 | 55 | 42 | | | | 0 | 1 | 35.5 | 75.5 |
| 2 | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල කඩ කමර 03 පිහිටි ඉඩම | රෝහල පාර | | කඩ කාමර | | | | | | | | 0 | 0 | 3 | 3 |
| 3 | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල කඩ කාමර 01 පිහිටි ඉඩම | රෝහල පාර | | කඩ කාමර | | | | | | | | 0 | 0 | 0.25 | 0.25 |
| 4 | පහලේ වෙල | දිවිතොටවෙල | පොදු කටයුතු සඳහා | | | 154 | 55 | 57 | 1541 | | | 0 | 0 | 3.1 | 3.1 |
| 5 | වැරැල්ල හින්නේ පතන | දිවිතොටවෙල 59 D | ප්‍රාදේශීය සභා නිවාස සහ නිල නිවාස පිහිටි ඉඩම | | | | 55 | 51 | 510 | | | 1 | 0 | 2 | 162 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | දිවිතොට වෙල මුතු උයන මුතුවැල්ගොඩ හේන | දිවිතොටවෙල | පොදු කටයුතු සඳහා | ප්‍රජා ශාලාවක් ඉදිකරමින් පවති | | | | 2 | | 1174 | 16719 | 0 | 0 | 10 | 10 |
| 7 | කුරුදිය වෙල බොක්කේ පතන සහ මලරාවේ කපොල්ල පතන | උඩුපිල්ල ගම | පොළ භූමියක් සඳහා වර්තමානයේ ඩයරබා උප කාර්යාලය පිහිටි ඉඩම) | වර්තමානයේ දඹවින්න උප කාර්යාලය පිහිටි ඉඩම | ඇත | | 62 | 69 | 553 | 6701 | | 1 | 0 | 8 | 168 |
| 8 | පළතුරු වත්ත ක්‍රීඩා පිටිය | කොටකිතුල 60 C | ක්‍රීඩා පිටියක් සඳහා | පළතුරු වත්ත ක්‍රීඩා පිටිය | | | 69 | 130 | | | | 1 | | 0 | 200 |
| 9 | ගෝන ගොල්ල ඉඩම | ගුරුතලාව | ජලය ලබාගන්නා ස්ථානයක ගස් වැවීම | | ඇත | | 189 | 222 | 3467 | | | 1 | 0 | 0 | 160 |
| 10 | මහතැන්න පතන | ගුරුතලාව | ක්‍රීඩා පිටියක් සඳහා | | ඇත | | 189 | 144 | 3466 | | | 2 | 0 | 0 | 320 |
| 11 | බොරලන්ද ප්‍රාදේශීය සභා උප කාර්යාලය පිහිටි ඉඩම | 62 F රහංගල - නුවරඑළිය පාර | | ප්‍රාදේශීය සභා උප කාර්යාලය සහ බොරලන්ද නුවරඑළිය පාර දකුණ කඩ කාමර 07 | නැත | | 190 | 897 | | | | 0 | 0 | 32.6 | 32.06 |
| 12 | කරමැටියේ පතනනිල නිවස පිහිටි ඉඩම | බොරලන්ද | කාර්යාලීය ගොඩනැගිල්ලක් සඳහා | නිල නිවස පිහිටි ඉඩම බොරලන්ද | ඇත | | 456 | 627 | 3072 | | | පැහැදිලි නැත | 2 | 0 | 80 |
| 13 | කරමැටියේ පතන | බොරලන්ද | සමිති ශාලාවක් සහා ක්‍රීඩා පිටියක් සඳහා | | ඇත | | 56 | 641 | 4037 | | | 0 | 1 | 36 | 76 |
| 14 | බොරලන්ද නගරයේ පිහිටි පොළ භූමිය | 62 F රහංගල - නුවරඑළිය පාර ගොවිජන සේවා කාර්යාලය අසල | | පොළ භූමිය පවත්වා ගෙන යනු ලබයි | නැත | | 190 | 248 | | 7449 | | 0 | 1 | 0 | 40 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 15 | බොරලන්ද නගරය වැසිකිළිය පිහිටි ඉඩම | 62 F රහංගල - හපුතලේ පාර | | වැසිකිළි පද්ධතිය | | | 190 | 439 | | | | 0 | 0 | 10 | 10 |
| 16 | ගලබොඩ පතන | හින්නාරංගොල්ල | ක්‍රීඩා පිට්ටනියක් සහ සමිති ශාලාවක් සඳහා | | ඇත | | 190 | 12 | 3546 | | | 1 | 3 | 38 | 318 |
| 17 | හපුගස්තැන්න පතන | හින්නාරංගොල්ල | නිවාස යෝජනා ක්‍රමයක් සඳහා | | | 21 | 190 | 221 | 3139 | | | 3 | 0 | 0 | 480 |
| 18 | අම්බලන්තැන්නේ පතන | උඩලකුඹුර | සමිති ශාලාවක් සඳහා,ක්‍රීඩා පිටියක් සඳහා | | ඇත | | 191 | 179 | 3961 | | | 0 | 1 | 38 | 78 |
| 19 | නියදගල පතන | කොටවෙර පල්ලේගම | ජලටැංකියක් සඳහා | | ඇත | | 388 | 412 | 2560 | | | 0 | 0 | 18 | 18 |
| 20 | නියදගල පතන | වැල්ල වත්ත | නිල නිවාස දෙක මෙයින් එක් නිවාසයක් විදුලි බල මණ්ඩලයට පවරා දී ඇත | | | | | | | | | 1 | 1 | 30 | 230 |
| 21 | නියදගල පතන | 52 A වැලිමඩ නගරය | ප්‍රාදේශීය සභා පැරණි කාර්යාලය | අනවසර පදිංචිකරුවන් | | | 388 | 414 | | | | 0 | 2 | 0 | 80 |
| 22 | පට්ටිය මැදවත්ත කොඩිකණුව වේදිකාව පිහිටි ඉඩම | කොටවෙර පල්ලේගම | වේදිකාවක් සඳහා | | | | 388 | 404,149 | | | | 0 | 0 | 2.19 | 2.19 |
| 23 | පට්ටිය මැදවත්ත තුන්මුල්ල ඉඩම | නො.12, කර්ක්ලීස් පාර | | ලංකා බැංකු ගොඩනැලිල්ල සහිත ඉඩම | | | 388 | 411 | 6608 | | | 0 | 0 | 31 | 31 |
| 24 | වැලිමඩ පොල භූමිය | කොටවෙර පල්ලේගම 52 A වැලිමඩ නගරය | පොල භූමිය | පොල භූමිය | | | 388 | 408 | | 6599 | | | 3 | 2 | 122 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 25 | නව වෙළඳ සංකිර්ණය | කොටවෙර පල්ලේගම ,52 A වැලිමඩ නගරය | නව වෙළඳ සංකිර්ණය වැලිමඩ | | | | 388 | 145 | | | | 0 | 3 | 7 | 127 |
| 26 | මාදෝවිට | ඉඩමේගම | | | | 159 | 451 | 269 | 1725 | | | 0 | 0 | 9.4 | 9.4 |
| 27 | උඩගොඩ වත්ත, වලරාවේ පතන | මටිකුඹුර | ලිඳක් සඳහා | | ඇත | | 454 | 156 | 2410 | | | 0 | 0 | 2 | 2 |
| 2 | බෝගහකුඹුරේ පතන | බෝගහ කුඹුර | මාතෘ නිවාසයක් සඳහා | තැන්නේ කුඹුර ප්‍රාදේශීය සභා උප කාර්යාල, | ඇත | 95 | 458 | 485 | 886 | | | 0 | 3 | 37 | 157 |
| 29 | මහවක දෝව | රජකදුරුවෙල | උදුනක් සහ කාණු පද්ධතියක් | | | 804 | 505 | 166,167 | 804 | | | 0 | 1 | 6 | 46 |
| 30 | පීල්ලේ උල්පත, මඩමේ වත්ත | මුදුන්පිටගම | ක්‍රීඩා භූමියක් සඳහා | | | 30 | 506 | 94 | 3173 | | | 0 | 1 | 24 | 64 |
| 31 | පුරනේ කපොල්ල | හෙවණ කුඹුර | ප්‍රජාශාලාවක් සඳහා | | | 145 | 513 | 531 | 1375 | | | 1 | 0 | 5 | 165 |
| 32 | උගුරුස්ස කුඹුරේ හින්නේ පතන | හෙවණ කුඹුර | ප්‍රජා ශාලාවක් සඳහා | | ඇත | | 513 | 541 | 1954 | | | 0 | 2 | 0 | 80 |
| 33 | අඹගහකදුරේ හින්න/අඹගහකඳුරේ පතන | හෙවන කුඹුර | ලිඳක් සඳහා | | | 80 | 513 | 526 | 803 | | | 0 | 0 | 1 | 1 |
| 34 | වෙලංගස් ඇල්ල ඉඩම | අංක 03, 04, 05 නුවරඑළිය පාර | | ජී.එච්. ජගත් කාන්ත ද සිල්වා, ජී.එස්. පෙරේරා මිය, පියදාස අඹේපිටිය වෙත බදු දී ඇත | | | 517 | 75 | | 1650 | | 0 | 1 | 9.1 | 49.1 |
| 35 | ගාලවගුර | නුගත ලාව | නව නිවාස සංකීර්ණයක් සඳහා | | | 112 | 518 | 151 | 858 | | | 0 | 1 | 9 | 49 |
| 36 | තිබොල්පැලැල්ලේ පතන | එරබද්ද | ප්‍රජාශාලාවක් සහ ක්‍රීඩා පිටියක් සහ ආයුර්වේදයක් සඳහා | | | 73 | 520 | 162 | 601 | | | 2 | 3 | 29 | 469 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 37 | කරගස්ව ගුර | පාලුගම | මාතෘ නිවාසයක් සඳහා, කුලී නිවාසයක් සඳහා | | ඇත | 110 | 521 | 53, 54 | 1058 | 6980 | | 4 | 0 | 12 | 652 |
| 8 | ගල්ගොඩ පතන | පාලුගම | ක්‍රීඩා පිට්ටනිය ක් සඳහා | | ඇත | | 521 | 290 | 29 | | | 2 | 0 | 1 | |
| 39 | ටිකිහාතැ න්න නොහො ත් විල්ස න්තැන්න (කැප්පෙ ටිපොල උප කාර්යාල ය පිහිටි ඉඩම) | පාලුගම | කාර්යාලය ක් සඳහා | | ඇත | | 521 | 461 | 3079 | | | 0 | 0 | 31 | 31 |
| 40 | විල්සන් තැන්න | පාලුගම | බස්නැවතු ම්පොල | | | 162 | 522 | 92 | 1705 | | | 0 | 1 | 3 | 43 |
| 41 | විල්සන් තැන්න | පාලුගම | කාර්යාල ගොඩනැගි ල්ලක් සඳහා | | | 305 | 522 | 94 | 3136 | | | 0 | 1 | 0 | 40 |
| 42 | නිල්ඇ ල්ලේ පතන | පාලුගම | කැලි කසල දැමීමට පෝරණුව ක් සඳහා | | ඇත | | 521 | 499 | 3165 | | | 0 | 2 | 0 | 80 |
| 43 | ඉස්කො ලේ වත්ත (කැප්පෙ ටිපොල පොදු වැසිකිළිය ඉදිකර ඇත) | පාලුගම | ගම් කාර්ය සභාවට අයත් ගොඩනැගි ල්ලක් සඳහා | කැප්පෙ ටිපොල පොදු වැසිකිළි ය ඉදිකර ඇත | ඇත | | 522 | 99 | 3070 | | | 0 | 0 | 14 | 14 |
| 44 | තැන්නේ වත්ත පතන | රත්කර ව්ව | ප්‍රජා ශාලාවක් සඳහා | | | 148 | 460 එ | 546 | 1418 | | | 0 | 1 | 6 | 46 |
| 45 | කඩනිලග ල දොරකඩ කුඹුර | ඔරලෝ සු කණුව අසල | පොදු වැසිකිළිය | පොදු වැසිකිළි ය | | | | | | | | 0 | 2 | 10.6 5 | 50.65 |
| 46 | කඩනිලග ල දොරකඩ කුඹුර | නො.6 6 බදුල්ල පාර,අග ම්පොඩි ගම | | බස් නැවතු ම්පොල ලෙස භාවිතා කරයි. | | | | | 3895 | | | 0 | 1 | 7.4 | 47.4 |
| 47 | උඩදේ මෝදර ඉඩම (බී එච් එස් ගොඩනැ ගිල්ල අසල) | නුවරඑ ළිය පාර | පොදු වැසිකිළිය ක් සඳහා | | ඇත | | | | 347 | 6436 /ඒ | | | 0 | 10 | 10 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 48 | බුහාලමුල්ලේ පතන/මඩවල මුල්ලේ පතන (තුරු උයන) | | | | | | | | | | 8755 | 0 | 0 | 10 | 10 |
| 49 | මීරහවත්ත වත්ත | වැලික ඩගම 60 D | | | | | | 36, 45, 51 | | 1710 | 23 | 0 | 1 | 4.7 | 44.7 |
| 50 | පැරණි ගව ඝාතක ස්ථානය සහ ජල ටැංකියේ ඉඩම | මුස්ලීම් විදුහලට යාබද ඉඩම | | | | | | | | | | 0 | 2 | 0 | 80 |
| 51 | ග්ලෙනෝර්වි වත්ත (ප්‍රයිම්ලෑන්ඩ් පුද්. සමාගම විසින් කොටස් කරන ලද ඉඩම) | 49 D අල කොල ගාල | පොදු කටයුතු සඳහා | | | | | 30 | | | 1476 | 0 | 0 | 36.3 | 36.3 |
| 52 | ග්ලෙනෝර්වි වත්ත (ප්‍රයිම්ලෑන්ඩ් පුද්. සමාගම විසින් කොටස් කරන ලද ඉඩම) | 50 D අල කොල ගාල | පොදු කටයුතු සඳහා | | | | | 46 | | 3863 A | 4943 | 0 | 1 | 15.15 | 55.15 |
| 53 | ග්ලෙනෝර්වි වත්ත හූමි රියල්ටි හෝල්ඩින් ප්‍රයිවට් ලිමිටඩ් විසින් කොටස් කරන ලද ඉඩම) | 49 D අල කොල ගාල | පොදු කටයුතු සඳහා | | | | | 28 | | 3408 | 1250 | 0 | 3 | 0 | 3 |
| 54 | ග්ලෙනෝර්වි වත්ත හූමි රියල්ටි හෝල්ඩින් ප්‍රයිවට් ලිමිටඩ් විසින් කොටස් කරන ලද ඉඩම) | 49 D අල කොල ගාල | පොදු කටයුතු සඳහා | | | | | 15 | | 3408 | 1251 | 0 | 0 | 24.9 | 24.9 |

05.යථාපරිදි කල් දී ඇති යෝජනා

**යෝජනා අංක - 01**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, උප සභාපති හා ගරු මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලාගේ 2025 ජූලි මස මන්ත්‍රී දීමනා වශයෙන් රු:675,000.00ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ඊ.එම්.ප්‍රේමරත්න මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර එ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.07.31 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක - 02**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන් 36ක් සඳහා ජූලි මස දෛනික වැටුප් වශයෙන් රුපියල් 2,284,792.29 ක මුදලක් සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා**_විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර එ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.07.31 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී , නිලූකා කුසුම් කුමාරි මැතිණිය,**

ප්‍රාදේශීය සභා මන්ත්‍රී , නිලූකා කුසුම් කුමාරි, බෝගහවත්ත, ගිරාඹේ, නුගතලාව. 2025.07.18 සභා ලේකම්තුමා මඟින්,සභාපතිතුමා,ප්‍රාදේශීය සභාව,වැලිමඩ,ගරු සභාපතිතුමනි,2025 ජූලි මස මහ සභා වාරය සඳහා ඉදිරිපත් කරනු ලබන කල් දී ඇති යෝජනාවයි, දිවුරුම්ගම කොට්ඨාශයේ දිවුරුම්ගම , නිවාස යෝජනා ක්‍රමය යටතේ ගමට ලැබී ඇති ප්‍රජා ශාලාව ඇතුළු ගොඩනැගිලි 03 කින් යුතු භූමියත්, ගිරාඹේ පාසල අසල පිහිටි ළමා උද්‍යානයත්,අම්පිටිය නැමැති බිම් කෙටසත් ,ගම තුළ ඇති මාර්ග පද්ධතියත්,දැනට නිවාස සංවර්ධන අධිකාරිය යටතේ පවතියි.මෙහි ප්‍රජා ශාලාව ඇතුළු භූමිය පර්චස් 38 ක් වන අතර එහි සීමාසහිත පුබුදු සර්වෝදය ශ්‍රමදාන සමිතිය මඟින් නව ගොඩනැගිලි 02 ත් ඉදිකර කොට්ඨාශයේ වසම් 02 නියෝජනය කරන රජයේ නිලධාරින්ගේ කාර්යාල කටයුතු සඳහා කුළී පදනම මත ලබා දී ඇත.එහෙත් එම ගොඩනැගිලි නිසි පරිදි නඩත්තුවක් සිදු නොවන අතර මේ වන විට විදුලි හා ජල සම්බන්ධතා විසන්ධි කර ඇත.එසේම මෙහි වසර 40 කට ආසන්න කාලයක් පෙර පාසලක් හා දහම් පාසලත් පවත්වාගෙන යනු ලබනවා.දිවුරුම් ගම නිවාස යෝජනා ක්‍රමය යටතේ මෙම ප්‍රජා ශාලාව ලබා දී ඇත්තේම පුස්තකාලයක් ද සමඟ වුවද මේ වන විට පුස්තකාලය හා පෙර පාසල වැසී ගොස් ඇති අතර පුස්තකාලය පැවති ස්ථානයේ සුබ සාධක සමිතියක භාණ්ඩ ගබඩා කර ඇත.එබැවින් කොට්ඨාශයේ වසම් 02 ටම මධ්‍යස්ථව පිහිටා ඇති ඉතා වටිනා ප්‍රජා ශාලාව ඇතුළු බිම් කොටසත්, පර්චස් 23 රූඩ් 01 කින් සමන්විත ළමා උද්‍යානයත්,පර්චස් 18.5කින් සමන්විත අම්පිටිය ඉඩමත්,ඇතුළු මාර්ග පද්ධතියත් ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර පවත්වාගෙන යන ලෙස මා මෙම ගරු සභාවට යෝජනා කරමි.ස්තුතියි. ප්‍රාදේශීය සභා මන්ත්‍රී , නිලූකා කුසුම් කුමාරි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික රන්දෙණිය මැතිතුමා** විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී සිත්ති හුසෙයිමා මැතිණිය පෙ.ව 9.25ට සභාවට පැමිණෙන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා,**

මීට පෙර පැවති සභාවේදී ද මෙම යෝජනාව ඉදිරිපත් කලා.නමුත් මෙම ගැටළුව විසඳුනේ නෑ. අම්පිටිය ඉඩමේ තියෙන පර්චස් ප්‍රමාණයෙන් ඉඩම් ප්‍රමාණයක් දැන් අඩු වෙලා තියෙනවා.එම ඉතිරි ඉඩම් ප්‍රමාණය තරුණ සමිතිය සඳහා ගොඩනැගිල්ලක් සදා ගැනිමට නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කිරිමෙන් අනතුරුව එහි අනුමැතිය ලැබි ඇතත්, යම් තැනක මේ ක්‍රියාවලිය නතර වෙලා තියෙනවා. සභාවට පවරා ගැනිමට කිසිදු ගැටළුවත් නැති අතර සභාවට පවරා නොගැනිම පිළිබඳ ගැටළුවත් තියෙනවා.ඒවගේම විදානගමගේ සෞඛ්‍ය ඇමති සිටි කාලයේ ළමා උයන සඳහා ලක්ෂ 08 හමාරක් ලබාගෙන වැට ගසා උපකරණ අළුත්වැඩියා කර සංවර්ධනය කලා.නමුත් සතියක් යෑමට මත්තෙන් එය විනාශ වුණා.ඇත්තටම මෙම යෝජනාව වටිනා යෝජනාවක් නිසා ළමා උයන ,පාරවල්,බිම් කොටස් සභාට පවරාගෙන ඉදිරි කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය,**

ගරු සභාපතිතුමනි, 2019 ජුලි මාසයේ මෙම යෝජනාව ඉදිරිපත් කලත් ඒ කාලයේ මෙය කර ගැනිමට හැකි වුනේ නෑ. මෙහි දි පර්චස් 38 කින් සමන්විත භූමියේ ප්‍රජා ශාලාව සඳහා නඩු කටයුත්තක් මේ වන විට පවතින අතර සීමාසහිත පුබුදු සර්වෝදය ශ්‍රමදාන සමිතිය මඟින් ගොඩනැගිලි 02ක් ඉදි කරලා තියෙනවා. එම ගොඩනැගිල්ලේ කොට්ඨාශයට අයත් රාජ්‍ය නිලධාරින් කාර්යාල පවත්වාගෙන යන අතර ඒ සඳහා කාර්යාල කුළියක් ද ගෙවනු ලබනවා. වසම තුළ සමිති විශාල සංඛ්‍යාවක් තිබුණත් එහි භාරකාරත්වය එක සමිතියක් විසින් දරණු ලබනවා. සීමාසහිත පුබුදු සර්වෝදය ශ්‍රමදාන සමිතිය මඟින් සාදා ඇති ගොඩනැඟිලි දෙකේ විදුලිය හා ජල සම්බන්ධතාවය ද විසන්ධි කර ඇත. පුස්තකාල කාමරය තුළ විදුලි මීටරය සවි කර ඇති අතර භාණ්ඩ ද එහි ගබඩාකර තිබෙනවා. එබැවින් පොදු කටයුත්තක් සිදු කරන්නට යෑමේදී විදුලිය ලබා ගැනීමට සිදු වූ විට විදුලිය ලබා ගැනීමට නිලධාරියෙක් සොයාගෙන යායුතු බැවින් එය මහත් කරදරයක් වී තිබෙනවා.එම නිසා මෙය සභාවට පවරාගෙන සභාව මඟින් නඩත්තු කරමු යැයි මා පවසා සිටිනවා. සෝමසිරි බණ්ඩාර මැතිතුමා මේ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව අපහසුතා අත්විදින බැවින් එතුමාත් අදහස් දක්වයි කියා මා හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය වසර ගණනාවක සිට පවතින දෙයක් වන අතරම දිවුරුම්ගම ග්‍රාමයේ සමිතියක් තුළ සිදු වූ ආරවුලක් නිසා සමිති දෙක දෙකට වෙන්වීමක් නිසා ඇති වූ ප්‍රශ්නයක් ය. දිවුරුම්ගම එක්සත් සුභ සාධක සමිතියේ කට්ටිය එක නඩුවක් ඉවර වෙනවිට තව නඩුවක් දානවා. අපිට මෙතන තියෙන මූලික ගැටුම අදාළ වන්නේ නැති අතර කෙසේ හෝ මෙතනින් ගම්මුන්ට මේ ප්‍රජා ශාලාව නිදහස් කර ගැනීමටයි අවශ්‍යා.අපි 2010 සිට දිවුරුම්ගම එක්සත් සුභ සාධක සමිතිය නමින් සමිතියක් පවත්වා ගෙන යනු ලබන අතර එය සෑම මසකම සවස 6.30ට ආරම්භ කරනු ලබනවා. එය පැවැත්වීමට යාමේදී මෙන්ම රජයේ රැස්වීමක් පවත්වන්නට යාමේදී ප්‍රජාශාලාවේ යතුර ගැනීමට මහත් අසීරුතාවයකට මුහුණ දෙනවා. තවද විදුලි මීටරය ඇති කාමරයට යකඩ පටි 03ක් දාලා ඉබි 9ක් දාලා තිබෙන අතර විදුලි බිල සඳහා එක දවසට අපිට රු250.00ක මුදලක්ද ගෙවීමට සිදුවෙනවා.

ප්‍රාදේශීය ලේකම්තුමාද සමිති දෙක කැඳවලා මේ ප්‍රශ්නය විසඳීමට පැමිණියත් මෙය විසඳීමට නොහැකි විය. සමිතිවල භාණ්ඩ තැබීමට ස්ථානයක් නොමැති නිසා එම භාණ්ඩ ගෙවල්වල තියෙනවා.ඒ නිසා අපි අම්පිටිය භූමියේ ගොඩනැගිල්ලක් සාදා ගැනීමට නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් සිදු කළා.ඉන්පසු දැනට කම්බි වැටක් ගසා එම කොටස වෙන් කර තියෙනවා.මේ ඉඩමට යාබඳව ඉන්න අය ඉඩම් කොටස් අත්පත් කර ගෙන තිබෙන අතර මෙම ගැටලුව නිරාකරණය කර සභාවට පවරා ගෙන මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,ඉහත කාරණය පිළිබඳව සෝමසිරි බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. මෙහි නීතිමය පසුබිම පිළිබඳව සොයා බලා අනෙක් කාරණා පිළිබඳව ද විශේෂ අවධානය යොමු කර

ඔබතුමාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර ඒ සඳහා අපගේ ද සහයෝගය ලබා දෙන බවත් මා ප්‍රකාශ කරනවා. තව ද එතුමියගේ යෝජනාව පැහැදිලිව සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. නමුත් අපට ලැබී ඇත්තේ එයින් ලබා ගත් කොටසක්ය. .ඒ නිසා ලබන සභා වාරයේ සිට මන්ත්‍රීවරයෙක් විසින් සිදුකරනු ලබන සම්පූර්ණ යෝජනාවේ සම්පූර්ණ පිටපතක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මන්ත්‍රීතුමා,**

ගරු සභාපතිතුමනි,ගරු සභාව නියෝජනය කරන මහජන නියෝජිතයින් විදිහට වැලිමඩ ආසනයේම පොදු ප්‍රශ්න වෙනුවෙන් මැදිහත් වෙමින් ග්‍රාමීය ජනතාවට ඇති ප්‍රශ්න සම්බන්ධයෙන් අදාළ තැනේදි මේවා ඉදිරිපත් කර අදාළ බලධාරින් ,නිලධාරින්,ආයතන මැදිහත් කරගෙන මෙම ගැටලු නිරවුල් කරගැනීමට උත්සාහ ගත යුතුය.ඒ අනුව මෙම මන්ත්‍රීතුමිය සභාවට එම ප්‍රශ්නය යොමු කරමින් අපගේ අදහස් ද ලබා ගැනීමට උත්සාහ කර ඇති බව මා විශ්වාස කරනවා.තවද පොදු දේපල සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නාවලියත් එහි එක් පැතිකඩක් ලෙස දැකීමට පුළුවන්.විශේෂයෙන්ම ගෙවුණු ඉතිහාසය තුළ කුමන රජයකින් හෝ ප්‍රජාවගේ අවශයතාවන් වෙනුවෙන් ඉදිකර දී ඇති පොදු සම්පත් අපි පරිහරණය කරනවා වගේම අනාගත පරපුරටත් ඒවා ඒ අයුරින්ම භුක්ති විඳීමට අවස්ථාව සලසා දිය යුතු වෙනවා.මේ කියන ප්‍රශ්නයට අදාළ කාරණය ගත් විට පොදු ඉදිකිරීම්වලින් බලාපොරොත්තු වන්නේ ගමේ ප්‍රජාවගේ සාමූහිකත්වය වුවත් එය එසේ සිදු වී නොමැති බව මාගේ අදහසයි.

ඒ නිසා , මෙම ගැටලුව විසඳීම මෙතෙක් ප්‍රමාද වුවා විය හැකිය. වර්තමාන සභාව විදිහට ගරු සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ මඟ පෙන්වීම ලබාගෙන මේ කියන ප්‍රජාවට අවශ්‍ය නිරවුල් තත්වය ලබා දීමට ඉඩ ප්‍රස්ථාව සලසා දීමට, අත්පත් කර දීමට, සුදුසු බව මගේ පැත්තෙන් මා අදහසක් විදිහට ඉදිරිපත් කර සිටිනවා.

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාවේ විරෝධතා හෝ අදහස් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට දන්වා සිටින ලදි.

මේ සම්බන්ධව විරෝධතා , අදහස් හා යෝජනා නොමැති වූ හෙයින් මෙකී යෝජනාව 2025.07.31 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**ගරු මන්ත්‍රී ඊ.එම් ප්‍රේමරත්න මැතිතුමා,**

ඊ.එම්.ප්‍රේමරත්න,හිඹිලියගොල්ල,හපුතලේ පාර, බොරලන්ද, 2025.07.21 , ගරු සභා ලේකම්තුමා මඟින්, ගරු සභාපතිතුමා, ප්‍රාදේශීය සභාව, වැලිමඩ. ගරු සභාපතිතුමනි,ඉදිරි මාසික සභා වාරය සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවයි. අප ප්‍රාදේශීය සභාව වැලිමඩ බල ප්‍රදේශයේ ගම් මට්ටමින් ග්‍රාම නිලධාරි වසම් 64ටම අදාළ මට්ටමේ බොහෝ ප්‍රශ්න ගැටලු සඳහා ප්‍රදේශයේ ප්‍රජාව වෙනුවෙන් මැදිහත් වන නියෝජිත ආයතනයයි.සාමාන්‍යයෙන් මසකට වරක් රැස්වන අප සභාවේ මාසික සභා වාර අත්‍යවශ්‍ය තීරණාත්මක අවශයතාවයක් සේ අප සලකමු. මෙහිදී ප්‍රදේශයේ ප්‍රජාවට අදාළව බොහෝ කරුණු සාකච්ඡාවට ලක්ව බොහෝ අදහස් මතුවන අවස්ථාවක් වීම ඉතා වැදගත් සේ අප සලකමු.ඒ නිසාම මෙම වටිනා අවස්ථාව පිළිබඳව සකස් වන මාසික සභා වාර්තාව අප ප්‍රදේශයේ සමස්ථ ජනතාවම දැනුවත් වන වාර්තාවක් බවට පත්කර ලීමට අපට හැකි වන්නේ නම් ඉතා අගනේය. මෙම අවස්ථාව යම් පමණකට හෝ සපුරා දීම සඳහා අප සභාවේ මාසික වාර්තාව සභාවට අදාළ උප කාර්යාල ,පුස්තකාල තුළ ප්‍රදර්ශනය කර ප්‍රදේශයේ ජනතාවට පරිශීලනය කර ගැනීමට අවස්ථාව සලසමින් කටයුතු කිරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි. ස්තුතියි. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ප්‍රේමරත්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්.කරුණාදාස මැතිතුමා** විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මහජනතාවට සභාවේ කටයුතු පිළිබඳව දැනුවත් කිරීම සඳහා සභා වාර්තාව වැලිමඩ ප්‍රාදේශීය සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කරන ලෙස මා ඉල්ලා සිටින අතර වෙබ් අඩවියේ වීඩියෝ ගැලරියේ ඇති වීඩියෝව පරීක්ෂා කරන ලෙසද මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ දක්වා සභා වාර්තා ප්‍රදර්ශනය කළේ සභාව තුළ පමණක්ද නැත්නම් සියලු උපකාර්යාල වලද යන්න පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින යෝජනාවක් වගේම තවත් අතපසුවීම්වෙලා තියෙනවා නම් එය ක්‍රියාත්මක කිරීමට නිවැරදි කර ගැනීමේ අරමුණින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බව මා ප්‍රකාශ කර සිටිනවා.

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාවේ විරෝධතා හෝ අදහස් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වා සිටින ලදි.

මේ සම්බන්ධව විරෝධතා , අදහස් හා යෝජනා නොමැති වූ හෙයින් එම යෝජනාව 2025.07.31 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වාර්තා සලකා බැලීම**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

කාරක සභා වාර්තාවල සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පවසා සිටින ලදී.

I. 2025.07.08 දින මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

II. 2025.07.02 දින පරිසර හා සේවා කමිටු වාර්තාව මහ සභාව සලකා බලන ලදී.

**ගරු සිසිර දිලාන් මන්ත්‍රීතුමා,**ගරු සභාපතිතුමනි,පරිසර හා සේවා කමිටු වාර්තාවේ අංක 12 යටතේ සහභාගිත්වය සඳහන් කිරීමේදී සහභාගි නොවූ මන්ත්‍රීවරයෙක් යටතේ චූලනී ජයමාලි මන්ත්‍රීතුමියගේ නම සඳහන් වී ඇති අතර කමිටුව සඳහා පක්ෂය නියෝජනය කිරීමට සහභාගි වන්නේ මම බැවින් එය සංශෝධන කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

III. 2025.07.03 දින නිවාස හා ප්‍රජාකමිටු වාර්තාව මහ සභාව සලකා බලන ලදී..

**ගරු සිසිර දිලාන් මන්ත්‍රීතුමා,** ගරු සභාපතිතුමනි,එහි සහභාගිත්වය සඳහන් කර නොමැති බැවින් සහභාගිවූ අයගේ නාම ලේඛනය ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

කර්මාන්ත හා සේවා කමිටු වාර්තාවවේද පැමිණීමේ ලේඛනය නොමැති බැවින් ඊළඟ වාර්තාවේ සිට එම අතපසුවීමත් නිවැරදි කිරීමට අවශ්‍ය මැදිහත්වීම සිදු කරන බව පවසා සිටිනවා.

IV. 2025.07.04 දින කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව මහ සභාව සලකා බලන ලදී.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළයුතු වෙනත් ලේඛන**

ලැබීම් හා වියදම් පිළිබඳ 2025 ජූනි මස මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභා විසින් පිළිගන්නා ලදි.

**08. ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්**

පහත සඳහන් මන්ත්‍රීවරුන් විසින් ඔවුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදී..

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,අද දින අපේ පක්ෂයේ මන්ත්‍රීවරු න් 07 දෙනෙක් නියෝජනය කරනු ලබන අතර ඔවුන්ද ඉදිරියේ දි අපේ කමිටුවලට සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වෙනවා.වැලිමඩ 90% ගොවි ජනතාවගේ ප්‍රශ්න අතරින් අල ගොවියාගේ ප්‍රශ්න සාකච්ඡා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

බීජ ප්‍රශ්නය ,බෙහෙත් හා පොහොර මිල ඉහල යාම ,වන සතුන්ගෙන් හානි සිදු වීම යන කාරණා හේතු කොටගෙන අර්තාපල් ගොවියා එම ගොවිතැනින් ඉවතට යාමක් දක්නට ලැබෙනවා.අපි සභාවක් හැටියට ගොවීන්ගේ ප්‍රශ්න ගැන කථා කළ යුතු වගේම ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම්ද සපයා දිය යුතුය.නෝමන් ජයතිලක මැතිතුමා එදා රහංගලින් ආරම්භ කළ අර්තාපල් වගාවෙන් ජනතාව ආර්ථික ප්‍රශ්න විසදා ගනු ලැබුවා.නමුත් අද වනවිට එම තත්වය වෙනස් වෙලා තියෙනවා.ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව කාරුණික අවධානය යොමු කර බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට අර්තාපල් බීජ නිෂ්පාදනය කර බෙදා දීමේ වැඩ පිළිවෙලක් සකස් කර දෙන ලෙස මා යෝජනා කර සිටිනවා.ඔබතුමන්ලාගේ රජයේ මැදිහත් වීමෙන් වන සතුන්ගෙන් සිදු වන හානි වැලැක්වීමට වැඩ පිළිවෙලක් සකස් කර දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

එසේම බොරලන්ද නගරයේ වෙළඳ ප්‍රජාව සමඟ ඔබතුමා හා ලේකම්තුමා සහභාගි වී සාකච්ඡා කිරීමට තිබූ රැස්වීම සඳහා ඔබතුමන්ලා යාමට පෙර මට අහඹු ලෙස සහභාගිවීමට අවස්ථාව ලැබුණා.එහිදී ඔවුන් විසින් බොරලන්ද පොළේ ඉඩ් යතුරු දැමීම හා වෙනත් කරුණු පිළිබඳව ද කතා කල අතර ඔවුන් තුළ සභාව පිළිඳව පැහැදිලි දැක්මක් දක්නට නොලැබුණු බව ඒ කතාබහ තුළදී මට දැනුනා.නමුත් ඔබතුමන්ලා එයට සහභාගිවූ පසු ඔවුන් හා කළ සාකච්ඡාවේදී වෙළඳ ප්‍රජාව ඔබතුමන්ලා පිළිබඳව ඇතිකර ගෙන තිබූ අදහස් සම්පූර්ණයෙන්ම වෙනස් විය.

තව ද , සභාව හරහා බොරලන්ද පොළ පිටිය ඉදිරියේ හෙල බොජුන්හලක් ලබන මාසයේ විවෘත වන බැවින් එය දේශීය විදේශීය සංචාරකයන්ට මහත් රුකුළක් වෙයි කියා මා සිතනවා.සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා බොරලන්ද කලාපය සිත් ඇදගන්නා ආකාරයට සකස් කරමු. අප ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීම සඳහා පළතුරු පැල වගා කර එයින් බීම නිෂ්පාදනය කිරීමට කටයුතු සලසා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.එසේම මාලිගාතැන්න ප්‍රදේශයේ දේශීය විදේශීය සංචාරකයින් මුල් කොටගෙන හොටෙල් 03 කට වඩා -සෑදී ඇති බැවින් පුද්ගලික අංශයද මැදිහත් කර ගෙන බොරලන්ද නගරයේ සෆාරි කැබ් සර්විස් එකක් ආරම්භ තුළින් ඔහිය ,ඉදල්ගස්හින්න,අඹේවෙල යන ප්‍රදේශ වලට සංචාරකයින්ට ඒ තුළින් යා හැකිය. මෙම නව අදහස් පිළිබඳව ද සලකා බලා යම් වැඩ පිළිවෙලක් ඉදිරියේදී සිදු කරමු යැයි මා අදහස් දක්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, නව මන්ත්‍රීවරුන්ට සුභාශිංශන එක් කරන අතර වැලිමඩ නගරයේ ඇති වාහන තදබදය නිසා ඇතිවන ගැටළු හා පිළියම් මා පහත ලෙස ඉදිරිපත් කරන අතර ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

1. යතුරු පැදි තුලින් ප්‍රදේශය වැසී යනු ලබයි. ඒ නිසා බයිසිකල් නවතා තැබීමට නුවරඑළිය පාරේ සෙඩ් එක ඉදිරිපිට වෙන් කර දිය හැකි බව.
2. වෙළඳ ව්‍යාපාරිකයින්ගේ වාහන ඔවුන්ගේ ව්‍යාපාර කරන ස්ථානය ඉදිරිපිට නවතා තැබීම - දවස් දෙකක් හැර අනෙක් දවස් දෙක සඳහා පොළ භූමිය ලබා දිය හැකි බැවින් ඒ සඳහා මුදලක් අයකර ක්‍රමවේදයක් සකස් කර දීම.
3. ත්‍රිරෝද රථ ගාල් 05 තුළම "වාහන නැවැත්වීම තහනම්" කියා දැන්වීම් පුවරු සකස් කර ප්‍රදර්ශනය කිරීම - ත්‍රිරෝද රථ එක්වරකට නැවතිය හැකි ප්‍රමාණය සීමා කිරීම.
4. රථ වාහන නවතා තැබීම් ගාස්තු අය කරන අය වාහන නැවැත්වීමට ප්‍රථම ටිකට් කැඩීම - ඒ සඳහා විකල්පයක් යොදා ගැනීම.

5. ආයතන ඉදිරිපිට බෝඩ් ගසාගෙන තිබෙන්නේ අවසර ලබා ගෙනද යන්න.

තවද, ඉන්දික රන්දෙණිය මන්ත්‍රීතුමා සභාව සතු ඉඩම් ගැන අසා සිටියා. එහි පෙට්‍රල් සෙඩ් එක ඉදිරිපිට ඉඩම සභාව සතු ඉඩමක්ද යන්න පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. බොහෝ කඩවල් ප්‍රමාණයක් සැලැස්මට විරුද්ධව සාදා ඇති බව පෙනෙන බැවින් සභාව සතු ඉඩම්වල සැලැස්මත් තියෙනවාද ඒ පිළිබඳව සොයා බලා ක්‍රියාමාර්ග ගැනීමට හා එම කඩවල් වලින් අප සභාවට ලැබෙන ආදායම් තත්වය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පද්මිණී මැතිණිය,**

ගරු සභාපතිතුමනි, ඩයරබා සංසන්ධියේ ඇති කසල මාස ගණනකින් එකතු කිරීමට පැමිණ නැත.එබැවින් කසල එකතු වී කසල කන්දක් ලෙස ගොඩ ගැසී ඇත. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් ප්‍රේමලාල් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, අපේ පක්ෂ සියලු දෙනාටම නායකත්වය ලබා දීම සඳහා පත්වීම වෙනුවෙන් මාගේ ගෞරවනීය ස්තුතිය සභාපතිතුමාට පිරිනමන අතර සභාව නැති කාලයේ සභාවේ කටයුතු නිසි ආකාරව සිදු කිරීම සම්බන්ධව ලේකම් තුමාට ද මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

මා අවුරුදු 25 ක් පමණ කාලයක් පදික වෙළදාමෙන් ජීවත් වූ අතර එහි වෙළදාම් කිරීමෙන් පසු සභාවට පැමිණියා.ඒ කාලයේ වැලිමඩ නගරය ජනාකීර්ණ වී තිබූ නිසා සහ වාහන තදබදය නිසා එදා පදික වෙළදාම කාටත් වදයක් වී තිබුණා .එදා සභාවේ සියලු දෙනාගේම මතය වූයේ පදික වෙළදාම ඉවත් කිරීමයි.ඒ අවස්ථාවේදී මා ඔවුන්ට කුමන හෝ විසඳුමක් ලබා දෙන තුරු ඉවත් නොකරන ලෙස ඉල්ලා සිටියා.නමුත් සභාව විසින් විනිවිදභාවයෙන් යුතුව කඩ ඉදි කරනු ලැබුවා. එම පදික කඩවල් වල කමිටුවේ සභාපතිවරයා ලෙස මා කටයුතු කල අතර ලේකම්වරයා ලෙස කටයුතු කලේ නානායක්කාර මහතාය. භාණ්ඩාගාරික වූයේ ගාමිණී මහතාය.මෙම කඩවල් සෑදීම සඳහා පදික කඩ වෙළඳුන් විසින් අපේ ගිණුම් වලට මුදල් බැරවී තිබෙන බවට චෝදනා කරනවා. නමුත් එදා ඒ කඩ සෑදුවත් විධිමත් ක්‍රම වේදයක් නොමැතිව ඔවුන්ගේ හිතුමතේට එහි වෙළදාම් සිදු කිරීමට ස්ථාන ගත වුණා . එසේ ස්ථානගත වී දැන් ඔවුන් විසින් සභාවට චෝදනා එල්ල කරමින් සිටියි.එබැවින් ප්‍රාදේශිය සභාවක් ලෙස ඒ සඳහා ගතයුතු නීතිරීති ක්‍රියාත්මක කරන ලෙස හා ගිවිසුම් ගත නොවුණු කඩ ඇත්නම් සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙසද මා ඉල්ලා සිටින අතර ඔවුන්ට වැසිකිලි පහසුකම් , බස්නැවතුම් ස්ථාන ආදිය සකස් කර දෙන ලෙසද ඉල්ලා සිටිනවා.

තවද, වැලිමඩ ප්‍රාදේශිය සභාව වැඩිම ආදායමක් සභාවක් වුවත් අයතා ලෙස මුදල් අයකිරීමක් සිදු වෙන බව මා ප්‍රකාශ කර සිටිනවා.එසේ නොකර ආදායම් මාර්ග හඳුනාගෙන කටයුතු සිදු කරන ලෙස මා ප්‍රකාශ කර සිටිනවා . ඒ වගේම රථවාහන කමිටුවෙන් සැලැස්මක් සාදා වාහන සම්බන්ධයෙන් කටයුතු සිදු කරන ලෙසත් , පහළ වීදියේ නවතා ඇති බයිසිකල්වලට ක්‍රියා මාර්ග ගන්නා ලෙසත් වෙළඳ සංකීර්ණයේ වාහන නැවැත්වීමට සකස් කර ඇති ස්ථානයට වඩා වැඩි ආදායමක් ලැබෙන කාර්යයක් සිදු කිරීමට කටයුතු සිදු කරන ලෙසත්, B.S.H. එක ළඟ ඉඩම්වලට සැලසුම් සෑදූ බැවින් එම සැලසුම්වලට සභාව මැදිහත් වන ලෙසත්,මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, මීට අවුරුදු කිහිපයකට පෙර ගුරුතලාව කොට්ඨාශයේ 4 කණුවේ මස් කඩයක් තිබුණා. කඩයෙන් සභාවට රු:250,000.00ක මුදලක් ගෙවීමට තිබුණු අතර දැන් එම කඩය එම ස්ථානයේ නොමැත.මෙනිසා මේ සම්බන්ධව දැනට තත්වය පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.ඒ වගේම මීට වසර 05කට පෙර මුස්ලිම් ජනතාවගේ උත්සව වලට හරක් කැපීමේ බලපත්‍රය සඳහා රු.500.00 ක මුදලක් අය කරනු ලැබුවා. නමුත් දැන් එය රු:7,000.00 දක්වා වැඩි වෙලා තියෙනවා. නමුත් වෙනත් සභාවල්වල මෙපමණ මුදලක් අය කරන්නේ නැත.එබැවින් මේ මුදල මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් හැකි ඉක්මණින් අඩු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

පාසල් අධ්‍යාපනයෙන් පසුව තරුණයින් හට යෞවන සමාජය හරහා විවිධ වැඩසටහන්වලට යොමු විමට අවස්ථාව තියෙනවා. මාද යෞවන සමාජයෙන් බිහිවුණු තරුණ නායකයෙක් ලෙස හා යොවුන් පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රිවරයෙක් ලෙසත් මෙම යෞවන සමාජය පිළිබඳව කතා කල යුතුය. ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලන අර්බුධ අතුරු ව්‍යවස්ථාවේ 1:2 වගන්තියේද ප්‍රාදේශීය බල මණ්ඩලයේ 10:2 වගන්තියෙන්ද තරුණ පිරිස් ඒකාබද්ධ කරලා රටට සේවය කරන්න ,ජනතාවට සේවය කරන්න ඕනි කියන පණිවිඩය දීලා තියෙනවා. එසේම විවිධ දේශපාලන පක්ෂවලට තරුණ සමිති තියෙනවා.සමගි ජනබලවේගය,මුස්ලිම් කොංග්‍රසය,පොදුජන පෙරමුණ,ජාතික ජන බලවේගය යන පක්ෂවලට තරුණ සමිති තියෙනවා.මේ හරහා ඔවුන්ට දේශපාලනය කිරිමට හැකියාව තියෙනවා.ඒ වගේම යෞවන සමාජ තුල කටයුතු කරන්නේ පාට,පක්ෂ භේදයකින් තොරවයි. නමුත් අද වන විට ප්‍රාදේශිය මට්ටමේ යෞවන සමාජවලට පවා දේශපාලනය ඇවිත් තියෙනවා.මේ නිසා තරුණ තරුණියන්ට අද වන විට ඉඩක් නොදෙන තත්වයට ඇවිත් තියෙනවා.

1960 ලතින් ඇමරිකානු වෙගුවරයා කිසිම තරුණයෙක් එකම දේශපාලන කඳවුරකට කොටු නොවිය යුතු බවත්, එසේ දේශපාලන කඳවුරකට කොටු වන්නේ නම් ඔවුන් ස්වෙච්ඡා වැඩ නතර කල යුතු බවත් අදහස් දක්වලා තියෙනවා. ඒ කියන්නේ දේශපාලනය භාවිතා කරන ආකාරය අනුව වෙනස් වන බවයි.එසේම 1979 සිට මේ දක්වා යෞවන සමාජයට ලාංජනයක් තියෙනවා. නමුත් අද වන විට එය වෙනස් වෙලා තියෙනවා .ජාතික ජව බලවේගයේ එකේ යෞවන සම්මේලනයේ මෙම ලාංජනය වෙස් වෙලා තියෙන අතරම වැලිමඩ යෞවන සමාජ පිහිටවන විට යෞවන සමාජයේ ලාංඡනයට ස්ටාර් මාර්ක් එකක් දලා තියෙනවා.මෙලෙස යෞවන සමාජවලට දේශපාලනය කොටු වෙන්න හොද නෑ තියලා මං හිතනවා.එවගේම ප්‍රාදේශිය මට්ටමේ සිට වයි එස් ඕ මහත්තයාට දේශපාලන තර්ජනයක් වෙලා තියෙනවා එනම් කියන අයව පත් කිරිමට හා ඉවත් කිරිමටය .මේ නිසා යෞවන සමාජවලට දේශපාලනය අවශ්‍ය නැති බව මගේ මතයයි.එවගේම යෞවන සමාජ හරහා නායකයින් බිහිවෙලා තියෙනවා. කලාකාරයින්, නායකයින්, අධයක්ෂවරුන්, විවිධ අංශවල නායකයින් බිහිවෙලා තියෙනවා. නමුත් ග්‍රාමීය මට්ටමේ තරුණ සමාජවලට දේශපාලනය ගෙනල්ලා තියෙන නිසා මෙම තත්ත්වය මග හැරිමට ඉඩ ඇත.මේ නිසා යෞවන සමාජවලට දේශපාලනය මැදිහත් විමට මා එදත් අදත් විරුද්ධ වන බව කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, තුවාන් කාසිම් මන්ත්‍රීතුමාගේ කථාවට අදහස් දැක්වීමක් මාත් කරන්න ඕනි.ගම තුල ඇති යෞවන සමාජවල දේශපාලන මැදිහත්විමත් මේතාක් නොවුන විදිහට මැදිහත් විම වර්තමානයේ දි දැක ගන්න ලැබෙනවා.එවගේම ගම තුල ඇති ස්වෙච්ඡා සංවිධානවලටද ඔබ ආණ්ඩුව හරහා දේශපාලනෙ මැදිහත් විමක් දක්නට ලැබෙනවා .යෞවන සමාජ තුල දේශපාලන කෝණයත් තියෙනවා .නැත්තේ නෑ. නමුත් ගම තුළ දේශපාලනය තිබුනත් තිබුණනම් තිබුණේ ඡන්ද කාලයට පමණයි.පොදු වැඩ වලදි මෙ දේශපාලන මතවාදයන් නෑ.එසේම ගම තුළ ඇති යෞවන සමාජ,ප්‍රජා පොලිස් කමිටුව,සිවිල් ආරක්ෂක කමිටුව යන කමිටු ද අද වන විට කොට්ඨාශ සභාව හරහා බලය අල්ලා ගැනීමට මැදිහත්වීම් සිදු කරන බව පෙනි යනවා. අපි මන්ත්‍රීවරු වශයෙන් කවදාවත් කණ්ඩායම් රැස්වීමක හො තරුණයන් වෙනුවෙන් ඇති පොදු දේවල් වෙනුවෙන් මැදිහත් වෙලා නෑ.ගමට තියෙන,ජනතාවට තියෙන අයිතියක් නිසා මෙයට දේශපාලන මැදිහත්විම් අපි කරන්නනේ නැ.එවගේම ගමට වැඩක් කිරිමට හා සමාජයට වැඩක් කිරිමට ඇති නිත්‍යානුකූල මෙම යෞවන සමාජ ඔබතුමාගේ පාක්ෂිකයින්ට පමණත් සිමා වුන එකක් නොවෙයි. අද තරුණ සංවිධානවල නිල තල දරන්නේ දේශපාලන බලවතුන්ගේ දූවා දරුවන්ය. මේ නිසා ගමේ තරුණයාට දේශපාලනයට එන්න තියෙන ඉඩකඩ ඇහිරෙනවා. තුවාන් කාසිම් මන්ත්‍රිතුමා කියූ පරිදි එතුමාත් එදා යෞවන සමාජයේ සමාජිකයෙක් ලෙස සිට එයින් පන්නරය ගෙන දේශපාලනයට පිවිසි අයෙක් ය.නමුත් වර්තමානයේ දි මෙය දේශපාලනයට ලක් වි ඇති නිසා ගමේ තරුණයාට එම ඉඩ ලැබෙන්නේ නැති බව මගේ අදහසයි.

තවද, ගමේ පවතින පාසල් වැසියාමට ඉඩ නොදි එය රැක ගැනිමට අපි කටයුතු කල යුතුය .අද වනවිට ළමුන් ජනප්‍රිය පාසල්වලට ඇතුළත් කිරිමට දෙමාපියන් උත්සහ කරනවා.මේ නිසා ගමේ තියෙන පාසල් වැසි යාමට ඇති ඉඩ කඩ වැඩිය.එසේම ගමේ පාසලද ළමුන්ට ඉගෙනිමට සුදුසු වටපිටාවක් සහිතව,පහසුකම්ක් සහිතව නගරයේ පාසලට මෙන්ම ගමේ පාසලටද ලබා දිය යුතුය. පළමු වසරට ළමුන්

ඇතුළත් කිරීමේ දි අදාළ නිර්නායකයන් අනුවම කටයුතු කිරීමට ඔබ ආණ්ඩුව මැදිහත් විම් කළයුතු බව මාගේ අදහසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, දෙවැනි වරටත් මේ සභාවට පැමිණීමට ලැබීම පිළිබඳව මා සතුට ප්‍රකාශ කර සිටිනවා.මා 2018 වර්ෂයේද සභාවට පැමිණ මංගල කතා වාරයේදී සිදු කලේ පඤ්ඤාසේන විද්‍යාලය , පාදිනාවෙල මුස්ලිම් විද්‍යාලය, ගණපති දෙමල විද්‍යාලය යන විද්‍යාලවල ළමුන් හට පාසල් නිමවීමෙන් පසු සිටිමට පාසල අසල බස් නැවතුම් පොළක් නැති නිසා එය ලබා දෙන ලෙස ඉල්ලීම් කලා.මෙවන තෙක් එය ඉටු වි නොමැති නිසා අදත් එම ඉල්ලිමම කරන්න සිදුවෙලා තියෙනවා.එසේම. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් අධයාපනයට මූලිකත්වය ලබා දී ඇති බැවින් පාසල් ළමුන්ගේ පහත ප්‍රශ්න විසඳා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

1. උදේ 6.30ට නුවරඑළිය ඩිපෝවෙන් පැමිණෙන බස් එකට ළමුන් නංගවා ගත්තොත් පමණක් පාසලට යාමට හැකි වෙනවා. නමුත් කැප්පෙටිපොළ ඩිපෝවෙන් අම්පාරෙ යන බස් එකේ අපේ ළමුන් දාගන්නෙ නැති බවද කැප්පෙටිපොළ ඩිපෝවෙන් සීසන් ලබා ගත්තත් ඒ ඩිපෝවෙ බස් නතර කරන්නේ නැති බව මා කියා සිටිනවා.
2. අදේ 6.30 බස් එක නැති වුවහොත් ළමුන් පාසලට යන විට පළමු කාල පරිච්ඡේදය අවසන් වී තියෙනවා.එබැවින් අපේ ගමට පාසල් බස් රථයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.
3. මුස්ලිම් පාසල් ප:ව:2.00ට අවසන් වන අතර ප:ව:2.20ට බදුල්ල ඩිපෝවේ බස් රථය ළමුන්ට නංගගෙන ඔවුන් බහින ස්ථානයෙන් බැසිමට ගිය විට එම ස්ථානවල බස් නැවතුම්පොලක් නොමැති බව පවසමින් ඈතට ගොස් බසය නවත්වයි..

   මේ නිසා මේ පිළිබද අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. තවද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ගයේ වෙන් කර ඇති අඩි 02ක ඉඩ කොටස තුළ අපේ කොට්ඨාශයේ පානීය ජලය සපයන ප්‍රධාන ජල නලය දමා කොන්ක්‍රීට් කර ඇත. මේ නිසා නඩත්තු කටයුතු කිරීම සඳහා ජල නල ඉවතට ගැනිමට අවශ්‍ය වුවත් එය සිදු කිරිමට නොහැකි වි ඇත .එබැවින් එම කොටස ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.ඒ වගේම අපේ ගමට ප්‍රජා ශාලාවක් සකස් කර ගැනීමට මැදවෙල පාරට හැරෙන ස්ථානයේ ඇති ඉඩම් කොටස වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.එසේම නගරයේ වාහන නවතා තැබිමේ ගාස්තු අයකරන අයට සුදුසු නිල ඇඳුමක් ලබා දෙන ලෙසද ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය,**

පළාත් පාලන මැතිවරණයෙන් මා පත්කළ දිමුතුගම කොට්ඨාශයේ ජනතාවට හා අපේ පක්ෂයේ නායකතුමා,මහලේකම්තුමා ,රවින්ද්‍ර සමරවීර මැතිතුමා,සීතා සමරවීර මැතිණිය යන අයට මාගේ ස්තූතිය පුදකර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ධනුෂ්ක තිලකසිරි මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,තුවාන් කාසිම් මන්ත්‍රීතුමා යෞවන සමාජ දේශපාලනිකරණයට ලක් වි ඇති බව කියා සිටියා.මීට පෙර ආණ්ඩුවල සිටි දේශපාලන නායකයන්ගේ දරුවන් දේශපාලනික වශයෙන් ඊළඟ පියවර ගන්න හදාගත්තේ යෞවන සමාජ තුළිනි. දේශපාලනික වශයෙන් පිරිහුණු පුද්ගලයන් විසින් අපි යෞවන සමාජ පිහිටුවන විට එය දේශපාලනීකරණයට ලක්වෙලා කියලා චෝදනා එල්ල කරනවා.ඒ බව උද්ඝෝෂණයට සහභාගි වූ අයගෙන් පැහැදිලිවම දැකගන්නට ලැබුණා.යොවුන් පාර්ලිමේන්තුව අවුරුදු 03ක් යනතුරු කැඳවලා තිබුවේ නැති අතර පසුව අපේ ආණ්ඩුවේ යෞවන කටයුතු භාර ඇමතිවරයා ,නියෝජ්‍ය ඇමතිවරයා,ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඊට සම්බන්ධ නිලධාරින් හා රටේ තරුණ පිරිස් සම්බන්ධ කර ගෙන වාර්ෂික වැඩ සැලැස්ම සකස් කළා..මේ යෞවන සමාජවල අපේ පිරිස් පමණක් පත්කර ගෙන කියන කාරණය මෙම සභාවෙන් ප්‍රකාශ වුණා.අපේ පක්ෂයේ පිරිස් පමණක් සහභාගි කර ගැනීමට අවශ්‍ය වුවා නම් මේ සඳහා අපේ ඇමතිතුමා ,නියෝජ්‍ය ඇමතිතුමා එකතුවෙලා මාධ්‍ය සාකච්ඡා පවත්වන්නේ නැති බව හා ඒ පිළිබඳව දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලබන්නේ නැති බවද මා ප්‍රකාශ කර

සිටිනවා.තවද යෞවන සමාජවල නිළධාරින් පත් කරන ආකාරය තුවාන් කාසිම් මන්ත්‍රීතුමා දන්න නිසා මෙය දේශපාලනික වශයෙන් සැසඳීම සාධාරණ නොවන බව මා සඳහන් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය,**

වැලිමඩ ප්‍රාදේශීය සභාවට පිටපොළ කොට්ඨාශය නියෝජනය කරමින් මා පත්කර එවීම පිළිබඳව මා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළ සියලු දෙනාට මේ අවස්ථාවේ ස්තූතිය පුද කර සිටිනවා. මා නියෝජනය කරන ප්‍රදේශයේ මෙන්ම වැලිමඩ ප්‍රාදේශීය සභාව මඟින් සිදු කරනු ලබන සියලු කටයුතු වලදී මාගේ සහයෝගය ලබා දෙන බව මේ අවස්ථාවේදී පොරොන්දු වෙනවා. එසේම මා නියෝජනය කරන ප්‍රදේශය පිළිබඳව එම්.එම්.දයාරත්න මන්ත්‍රීතුමා දීර්ඝ කථාවක් සිදු කරනු ලැබුවා.ඒ අනුව එම ප්‍රදේශයේ ගොවීන්ට අර්තාපල් වගා කිරීමට අවශය පසුබිම සකස් කර දීමටත් ,සංචාරක කර්මාන්තය දියුණු කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රවීන්ද්‍ර මන්ත්‍රීතුමා විසින් අදහස් දැක්වීමට දෙවන වරට අදහස් දැක්විම සඳහා නැගී සිටින ලදි.එම අවස්ථාවේ දි ගරු සභාපතිතුමන් විසින් මෙසේ ප්‍රකාශ කරන ලදි. රවීන්ද්‍ර මන්ත්‍රීතුමනි,රීති අනුව එක් මන්ත්‍රීවරයකුට කථා කළ හැක්කේ එක් වතාවක පමණි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සිත්ති උසෙයිමා මැතිණිය,**

ගරු සභාපතිතුමනි,මා නියෝජනය කරනු ලබන ගුරුතලාව කොට්ඨාශයේ අවුරුදු 18ක් පැරණි ප්‍රජාශාලාවක් ඇති අතර එහි පෙර පාසල,සමෘද්ධි රැස්වීම් ,ගොවිජන රැස්වීම් ආදිය පවත්වනු ලබනවා.මෙම ප්‍රජා ශාලාව ඉතාමත් පැරණි බැවින් මෙය වැඩි දියුණු කිරීමට කටයුතු සිදු කරන ලෙස හෝ නව ප්‍රජාශාලාවක් ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.ගිය සතියේ මාගේ නිවස ඉදිරිපිට පාර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය මඟින් සිදු කරනු ලබන අවස්ථාවට ඔබතුමන්ලා කිහිප දෙනෙක් සහභාගි වුණත් මා ඒ පිළිබඳව දැනුවත් නොවුණු බව මා පවසා සිටිනවා.ඒ වගේම මින් ඉදිරියට එසේ නොකරන ලෙසද මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තු කුමාර් මැතිතුමා,**

වතුකරයේ ජනතාවට 2016 දි රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවෙන් ගෙවල් 10,000ක් ලබා දුන්නා. එම රජය හරහා වැලිමඩ වතු කරයේ ජනතාවට විශාල සේවයක් කලා. ඒ වගේම වතුකරයේ ඇති නිල නිවාස කඩා වැටී ඇති බැවින් ඒවා සාදා දෙන ලෙස හා වතුකරයේ ජනතාවගේ වැටුප වැඩි කර දෙන ලෙසද ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එස්. දිනිෂා මැතිණිය,**

ගරු සභාපතිතුමනි,අපේ ඔහිය ප්‍රදේශයට ප්‍රවාහන පහසුකම් ප්‍රශ්න හා රෝහල් ප්‍රශ්න පවතින නිසා ඒ පිළබඳව අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,අද දින සභාව නියෝජන කරන මන්ත්‍රීවරුන්ට මාගේ සුභාශිංශනය එක් කරනවා.එවගේම වැලිමඩ නගරය තුල කසල එකතු කිරීමට යන ට්‍රැක්ටර් රථය නිසා හවස 6.00 සිට 7.00 දක්වා කාලය තුළ හේමපාල මුනිදාස මාවත හා ප්‍රධාන මාර්ගය තුළ දැඩි වාහන තදබදයක් සිදු වෙනවා. මේ නිසා බණ්ඩාරවෙල ,බදුල්ල ප්‍රදේශවලින් එන බස් ටවුන් එක වටේ ඒමට විනාඩි 15ක් පමණ ගතවෙනවා.මෙයින් ග්‍රාමීය ප්‍රදේශවලට යන ජනතාව මහත් අසීරු තත්වයට පත්වෙනවා.මෙයින් අපේ සභාව අපකීර්තියට පත්වෙන බැවින් තැනින් තැන පොඩි පොඩි කරත්ත වලින් කුණු එකතු කිරීම හෝ සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට වාහන නවතා තැබීම් ගාස්තු අය කරන අය වාහන නැවතීමට පෙර ටිකට් කඩනවා.ඒ අය පොල භූමිය කෙළවරේ සිට හේමපාල මුනිදාස මාවත තුල පමණක් ටිකට් කඩනවා.මොවුන් අහිංසක මිනිසුන්ගෙන් මුදල් අය කරන අතර ප්‍රධාන මාර්ගයේ කඩ හිමියන් ඔවුන්ගේ වාහන නවතා තැබුවත් ඒ සඳහා මුදල් අය කිරීමක් සිදු නොවන අතර ටිකට් කඩන අයගේ හැසිරීම හා කථා විලාශයද බොහොම කණගාටුදායකය. එබැවින් මේ පිළිබඳව දැඩි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ප්‍රාදේශීය සභාව හරහා පොදු සේවාවන් සිදු වන්නේ නම් අදාළ කොට්ඨාශයේ මහජන නියෝජිතයා දැනුවත් කරන ලෙසත්, සයිබු මැතිතුමාට ඇති ප්‍රවාහන ප්‍රශ්නය විසදා ගැනීම සඳහා ප්‍රවාහන අධිකාරියට ඉල්ලීමක් සිදු කිරීමෙන් එම කාර්ය සිදු කරගත හැකි බවත් මා කියා සිටිනවා.තවද සභාව පැවැත්වූ මුල් දිනයේද මා පවසා සිටියේ ජාතික දේශපාලනය ගැන කථා නොකර වැලිමඩ සංවර්ධනයට එම කාලය යොදා ගන්නා ලෙසයි.නමුත් මේ සභා වාරයේ දීද ඒ සම්බන්ධව කථා කිරීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටින අතර ඉදිරියේදීවත් ජාතික දේශපාලනයට නොයා සභාවෙන් විය යුතු කරුණු කාරණා හා බල ප්‍රදේශය තුළ ජනතාවට සිදු විය යුතු සේවාවන් පිළිබඳව කථිකාවට වෙලාව වෙන් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.එසේම අපේ කාලය සභාවේ කරුණු කාරණා සඳහා යොමු විය යුතු බැවින් ජාතික තරුණ සේවාව පිළිබඳවද මින් ඉදිරියට කථා කිරීමට අවශ්‍ය නැති බව කියා සිටිනවා.

තවද ,සභාවේ කථා නොකරන සියලු යෝජනා කමිටු හරහා යෝජනා සටහන් කලත් ඉන් ලැබෙන ප්‍රගතිය පිළිබඳ මේ සභාව දැනුවත් නොවන නිසා කාරක සභා අවස්ථාවක් ලබා ගෙන ලේකම්තුමා හෝ කාර්ය මණ්ඩලයේ නිලධාරියකු සභාව දැනුවත් කරන ලෙස මා යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා,**

ගුරුතලාව ප්‍රදේශයේ රාත්‍රී කාලයට විදුලිය අඩුවෙන් ලැබෙන බැවින් ජනතාව මහත් අසීරුතාවයන්ට මුහුණ දෙනවා. එසේම මෙම ජනතාවට ප්‍රජා ශාලාවක්ද නැති අතර ඒ අයගේ වියදමින් ප්‍රජා ශාලාවක් සාදා ගැනීමට තලාව පිට්ටනිය අසල පර්චස් 10 භූමිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා,**

මහජන නියෝජිතයින් ලෙස අපිව පත්කළ ග්‍රාමීය ජනතාවගේ අරමුණ වන රට හදන වැඩපිළිවෙල යටතේ සභාව නියෝජනය කරන අප සියලු දෙනාම වැලිමඩ ජනතාවට අදට වඩා යහපත් හෙටක් නිර්මාණය කරදීමේ අරමුණ අපට තියෙනවා.ඉතිහාසයේ එළවළු ගොවියාට අවශ්‍ය පහසුකම් තිබුණු අතර එම පහසුකම් රජය විසින් ලබා දුන්නා.නමුත් මේ වනවිට රාජ්‍ය අනුග්‍රහය ක්‍රමයෙන් අඩුවීගෙන ගොස් ඇත.බොරලන්ද බීජ පර්යේෂණ ආයතනය ක්‍රමයෙන් විනාශයට පත්කර අනුබද්ධ විශ්ව විද්‍යාලයක් සාදන ලදි.ඒ වගේම සීතාඑළිය, බිඳුණුවැව, කහගොල්ල, මහඉලුප්පල්ලම, යන ගොවීන්ට සේවයක් සැපයූ රාජ්‍ය ආයතන අපේ රටේ කණ්ඩායමක් විසින් ආක්‍රමණය කරගෙන තියෙනවා.ඒ අයගේ ආක්‍රමණයට ඔබ අප ,වර්තමාන පරපුර ගොදුරක් බවට පත්වී තියෙනවා.දැන් දේශීය බීජ සහ තාක්ෂණය අහෝසි වී සියල්ල මැලේසියන් හයිබ්‍රිඩ් වී තියෙනවා.ඒ නිසා අවුරුදු 30 ,40 ක ගමනක අවසානය අපි භුක්ති විදින බැවින් මෙය යථා තත්වයට පත්කර ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වන බව පවසා සිටිනවා.මේ සියලු ප්‍රශ්න ජාතික මට්ටමේ මෙන්ම ප්‍රාදේශීය මට්ටම දක්වා විසදා ගතයුතු බැවින් ඒ විසඳුම සෙවීමේදී ප්‍රාදේශීය සභාවක් විදිහට ඔබට මට අප සියලු දෙනාටම වගකිව යුතු කාර්යයන් තිබෙනවා. පසුගිය මැතිවරණයෙන් ආරම්භ කළ මෙම ප්‍රාදේශිය සභාව අවුරුදු තුන හතරක් ගොස් ආපසු හැරී බලන විට තවත් කථා සාප්පුවක් වෙන්න නොදී ඔබ අප සියලු දෙනාම වැලිමඩ හදන වැඩේට උර දෙමු කියා මා පවසා සිටිනවා.

ඒ වගේම පසුගිය සභා වාරය තුළත් සාකච්ඡා කළ අඹේවෙල වාරි ව්‍යාපාරයේ පානීය ජලය ලබා ගැනීමට නුවරඑළිය ජල සම්පාදන මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමේ පණිවිඩය මේ වන විට ගම්වලට යමින් පවතිනවා.ඒ නිසා මේ ගම්වල ජනතාව ඉල්ලීමට අදාළව විවිධාකාර ඉල්ලීම් හා යෝජනා සිදු කරමින් සිටින අතර මේ වන විට සභාව විසින් ඒ සම්බන්ධ තීන්දුව අවශ්‍ය තැන්වල යොමු කරමින් පවතී. ඒ වගේම වසර 60 ක් පැරණි අඹේවෙල වාරි ව්‍යාපාරය හෙටට ගැලපෙන ශක්තිමත් ව්‍යාපාරයක් බවට පත් කිරීමට වාරි මාර්ග දෙපාර්තමේන්තුවට ,රජයට ගොවි ජනතාව ලෙස බලපෑම් සිදු කරමු.වැලිමඩ ප්‍රධාන වාරි ව්‍යාපාරයක් වූ මෙම ව්‍යාපාරය ජලය පිළිබඳ ප්‍රශ්න ඇති අපේ සහෝදර ගම්වාසීන්ට ජලය ලබා දෙන්නට මෙම ව්‍යාපාරය සංවර්ධනය කිරීමෙන් පසු සූදානම් බව ප්‍රකාශ කර සිටිනවා.එසේම නුවරඑළිය ප්‍රදේශයට පානීය ජලය ලබා දීමේ ඉල්ලීම වලක්වාගත හැකි වන්නේ වැලිමඩ ප්‍රජාවගේ අවශ්‍යතාවයන් ඉෂ්ඨ කරන්න සූදානම් කියන විකල්පය ඉදිරිපත් කිරීමෙන්ය. මේ ව්‍යාපාරය කාලයට ගැලපෙන දැවැන්ත පූර්ණ සංවර්ධනයකින් අනතුරුව සෙසු ගම්මානවල ගොවීන්ගේ අවශ්‍යතා ඉෂ්ඨ කර ගැනීමේ ව්‍යාපාරයක් බවට පත් කරනවා නම් අඹේවෙල සියලු ගොවීන්ගේ අනුමැතිය ,එකඟතාවය ලබා දීමට සූදානම් බව එම ගොවි ජනතාව වෙනුවෙන් ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිණිය,**

ගරු සභාපතිතුමනි,වැලිමඩ ප්‍රාදේශීය සභාවට සහභාගිවන මේ මොහොතේ පොදු ජනතාවගේ ප්‍රශ්න ගැටලු සාකච්ඡා කිරීමේ වගකීමක් අප සියලු දෙනාටම පැවරෙනවා.සාමකාමී සභාවක ගනුදෙනු කර එකමුතුව ඉදිරියට යාමට අප සැදී පැහැදී සිටිනවා. පසුගිය සභා වාරයේදී විශාල සභා ගර්භයක් සෑදීමටත් ,ව්‍යාපෘති වැඩි දියුණු කිරීමටත් පුළුවන් වූ බැවින් ඒ සියළුම රජයන්ට මාගේ ස්තූතිය පුද කර සිටිනවා.

වැලිමඩ ප්‍රාදේශීය සභාවට සමගි ජන බලවේගය නියෝජනය කරමින් මා පත්කර එවීම පිළිබඳව මා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළ වංගියකුඹුර, හෙලයල්කුඹුර ,බොරලන්ද ජනතාවට හා .ප්‍රතිශත ගණනය කර මෙතනට එන්නට නම නිර්දේශ කළ රවීන්ද්‍ර සමරවීර මන්ත්‍රීතුමාටත්,සීතා සමරවීර මැතිණියටත්, සජිත් ප්‍රේමදාස මැතිතුමාටත්, මේ අවස්ථාවේ ස්තූතිය පුද කර සිටිනවා.මීට පෙර පැවති සභාවේදී කෝටි 16 ක වැඩ මා විසින් සිදු කල බව අභිමානයෙන් කියා සිටිනවා. අප අතර මන්ත්‍රීවරයෙක්ව සිට සභාපති ලෙස පත්වීම පිළිබඳව ගරු සභාපතිතුමාට මේ අවස්ථාවේදී සුභාශිංශන එකතු කරනවා.එසේම පක්ෂ භේදයකින් තොරව ඔබතුමන්ලාට අවශ්‍ය ශක්තිය ලබා දෙන අතර බොරලන්ද කලාපයේ මන්ත්‍රීවරියක් ලෙස එම ප්‍රදේශය දියුණු කිරිමට කටයුතු කරනවා තවද මීට පෙර සභාව තුළින් සෝලා පැනල් සවිකළා.නමුත් දැන් ඒවා අක්‍රිය වී ඇති නිසා නවීකරණය කරන ලෙස හා 2019 වර්ෂයේදී වංගියකුඹුර ,ඕලුගම ප්‍රජාශාලාව සංවර්ධනය කිරීමට ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව ද කටයුතු සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.මා සභාව විසින් ගන්නා නිවැරදි තීරණවලදී පූර්ණ සහයෝගය ලබා දෙන බව හා වැරදි තීරණ වලදී විරුද්ධ වන බව ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හාසිප් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, මෙම සභාව නියෝජනය කිරීමට පැමිණි සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්හට මා සුභාශිංශන පිරිනමනවා.ඒ වගේම සභාව විසින් මන්ත්‍රීවරුන්හට ලබාදෙන හැඳුනුම්පත ලබා දෙන ලෙස හා ගුරුතලාවේ විදුලි ගැටළුව විසඳීමට ට්‍රාන්ස්පෝමරයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. තුවාන්කාසිම් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි මුස්ලිම් ජනතාවගේ උත්සව වලට හරක් කැපීමේ දී අය කරන මුදල අඩු කරන ලෙසද ගුරුතලාව ,4 කණුව, නාවෙල කොට්ඨාශයේ ග්‍රාම සේවක මහතා හා සමෘද්ධි නිලධාරි මහතා කටයුතු නොකරන බැවින් ඒ පිළිබඳවද සොයා බලා කටයුතු කරන ලෙස ද ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,ඔබතුමන්ලා ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ආණ්ඩුවක් තැනීමට සැලැස්මක් ක්‍රියාත්මක කළ බව මේ කාලය තුළ දක්නට ලැබුනා.එවගේම කරුණාරත්න මන්ත්‍රීතුමා අදහස් දැක්වුවාට පසුව අදහස් දැක්වීමට මා සිටියා.එතුමා පැවති ආණ්ඩුවල දුර්වලතා නිසා ගොවියා අල ගොවිතැනින් ඉවත්වන බැවින් ඒ සඳහා ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස පවසන ලදි.ඒවගේම ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා ජාතික ජන බලවේගයේ අය තවම පසුගිය ආණ්ඩු වලට චෝදනා එල්ල කරමින් සිටියි. ජාතික ජන බලවේගය පත් වෙලා දැනට මාස කිහිපයක් වුවත් පෙර පැවති ආණ්ඩු කාලයේදි ගොවි ජනතාව වෙනුවෙන් කථා කළ කිසි කෙනෙක් පොහොර මිල හා බීජ මිල වැඩිවීම සම්බන්ධයෙන් කතා කිරිමට ඉදිරිපත් නොවුනි.එසේම තුවාන් කාසිම් මන්ත්‍රීතුමා යෞවන සමාජ ගැන කථාකළා.පසුගිය කාලයේ දි යෞවන සමාජ පිහිටුවීමේදි තනතුරු පත්කල අකාරය පිළිබඳව අප හොඳින් දන්නා අතර. එසේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සියලු දෙනාට ආරාධනා කරමින් යෞවන සමාජ පිහිටුවා ගත්තා නම් මේ තුල දේශපාලන නැති බව අපි පිලිගන්නා බව මා පවසා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,පසුගිය සභාව නියෝජනය කර දෙවන වරට ලැයිස්තු මන්ත්‍රීවරයෙක් ලෙස මා පත්කිරීමට ඡන්දය ලබා දුන් උඩුපීල්ල කොටගෙදර කොට්ඨශයේ ජනතාවට හා පක්ෂයේ සියලු නායකයින්ට මාගේ ස්තූතිය පුද කර සිටිනවා.අපි සභාවේ කටයුතු සිදුකළ කාලය තුළ ඩයරබා හන්දියට වැසිකිළියක් ලබා ගැනීමට උත්සාහ දැරුවත් එය සිදු කර ගැනීමට නොහැකි වුණා.නමුත් ලේකම්තුමා විසින් ඒ දේ සිදු කිරීම පිළිබඳව ඔබතුමාට ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා.

ඊළඟ කාරණය පළතුරු වත්ත ක්‍රීඩාංගනය වට කර කම්බි වැටක් ගසා ඇති බැවින් ,ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්,ඩයරබා හන්දියේ ගොඩගැසී ඇති කසල ඉවත් කර ඒ සඳහා විකල්පයක්

යොදවන ලෙසත් ඉල්ලා සිටිනවා.ඒ වගේම ඩයරබා හන්දියට ඉන්ධන පිරවුම් හලක් හා බැංකු ශාඛාවක් හෝ ATM යන්ත්‍රයක් ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා,**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලින් පෙනී යන්නේ පවතින ආණ්ඩුව ගොවියා ගැන හිතන්නෙ නෑ කියන කාරණාවයි.නමුත් මේ ආණ්ඩුව විසින් ගොවියාගේ ප්‍රශ්න වලට හේතු සොයාගෙන විසඳුම් ලබා දීමට කටයුතු සිදු කරනු ලබනවා.මෙතන යෞවන සමාජ ප්‍රශ්නයේ දී කලින් යෞවන සමාජවලට දේශපාලනය සම්බන්ධ නොවුණු බව හා දැන් ඒ සඳහා දේශපාලනය සම්බන්ධ වන බව ප්‍රකාශ වුණා.මෙච්චර කාලයකට යෞවන සමාජවලින් සිදුකළේ දේශපාලඥයින්ගේ දරුවන්ට දේශපාලනය කිරීමට අඩිතාලම සකස් කර දීමයි.දැන් අපේ දේශපාලනයක් තියෙනවා නම් පෝස්ටර ගහලා මිනිස්සු දැනුවත් නොකරන බව හා අද අපේ රටේ දරුවන්ට නියම යෞවන සමාජ අති කරලා ඇති බව මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉස්සර මිනිසුන් අල වගාවෙන් විශාල ලෙස ආර්ථිකය ගොඩනගා ගත්තත් දැන් අර්තාපල් සඳහා ඉහළ මිලක් නොමැති බැවින් ආර්ථිකය පහළ බැස ඇති බව මා පවසා සිටිනවා. ඒ නිසා පිට රටෙන් අල ගෙන්වීම සිදු නොකර සිටීමෙන් දේශීය අල ගොවියාට මිලක් ලබා දිය හැකි බව පවසා සිටනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,ග්‍රාම සේවා වසම් 64 සහ කොට්ඨාශ 24 ඇති ප්‍රශ්න ගැන කථා කළා.මෙයින් පැහැදිලි වන්නේ මෙතෙක් කල් කොපමණ සභා හා ආණ්ඩු තිබුණත් ප්‍රශ්න විසඳා නැති බවයි.ඒ නිසා මන්ත්‍රීවරු ගොඩක් දෙනෙකුට පෙර සභාවල සිදු කළ යෝජනා හා ප්‍රශ්න මේ සභාවේදී ඉදිරිපත් කිරීමට සිදුවෙලා තියෙනවා.මාලිමා ආණ්ඩුව මේ අවුරුදු 04ක කාලය අවසන් වන විට ජනතාවගේ සියලු ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට කටයුතු කරනවා.මීට පෙර පැවති සභාවන් මේ සභාව සමඟ සංසන්දනය නොකර වැලිමඩ ජනතාවට අපේ සියලුම පක්ෂ එකතුවෙලා සේවය කරමු යැයි මා කියා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර දිසානායක මැතිතුමා,**

ඉන්දික සේනාරත්න මැතිතුමා අසනිප තත්වයෙන් පසුවන බැවින් අද දින සභාව සඳහා සහභාගි විය නොහැකි බව දැනුම් දෙන ලදි.ඒ අනුව එම නිවාඩුව අනුමත කරමි.

ගරු මන්ත්‍රිවරුන් විසි හතර දෙනෙකු විසින් ඉතා වටිනා අදහස් හා යෝජනා ඉදිරිපත් කරනු ලැබුවා.ඒ සඳහා මා එම මන්ත්‍රිවරුන්ට ස්තුතිය පුද කර සිටිනවා.මෙහි දි දයාරත්න මැතිතුමා විසින් සංචාරක ව්‍යාපාරය ගැන සඳහන් කලා.අපි ආණ්ඩුවක් ලෙස මේ සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා කරමින් ඉන්න අතර අපේ ප්‍රදේශයේ තියෙන ආකර්ෂණීය ස්ථාන වන ඔහිය,අඹේවල හා ඉදල්ගස්හින්න දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීමට සැලැසුම් සකස් කරමින් පවතිනවා.එවගේම ඩයරබා හන්දිය සංචාරක මධ්‍යස්ථානයක් කර ගැනිමට සැලසුම් හදලා තියෙන අතර ඒ සඳහා මිලියන 10 ක වටිනාකමින් යුතු වැසිකිළි පද්ධතියක් සැකසිමට අදාළ යෝජනා ඇස්තමේන්තුගත වෙලා තියෙනවා. තවද දික්කාපිටිය - පුහුල්පොල මාර්ගයද කාපට් අතුරා සංවර්ධනය කරමින් පවතිනවා..මේ සියලු වැඩසටහන් සංචාරක ව්‍යාපාරය අරමුණු කරගත් වැඩසටහන් ය.

එසේම දයාරත්න මැතිතුමා අර්තාපල් වගාව ගැනත් කතා කලා.මෙහිදි මෙම ගැටළුව සඳහා තාවකාලික විසඳුම් ලබා දිලා වැඩක් නෑ.අපි මේ සඳහා ස්ථිර විසඳුම් ලබා දිය යුතු වෙනවා. අපේ ආණ්ඩුව පත් වුනාට පසුව ආනයනික අල වලට රු.60.00 ක බද්දක් දැම්මා.අද වන විටත් මේ බද්ද ක්‍රියාත්මක වෙනවා. නමුත් ඉන්දියානු , පකිස්ථාන අර්තාපල් ලංකාවට ගෙනල්ලා රු160.00 ට විකුණනවා.මේ නිසා අල ගැටළුවට බද්ද පමණක් වැඩි කරලා වැඩක් නෑ.දේශිය අල ගොවියා රැක ගැනිමට නම් නිෂ්පාදන පිරිවැය අඩු කරන්න ඕනි.ඒ සඳහා මුලිකවම බීජ අල මිල අඩු කරන්න සිදු වන අතර එසේ කිරිමට නම් බිජ අල අපි වගා කරන්න ඕනි.නමුත් අද අපට ඒ හැකියාව නොමැත .ආණ්ඩුවක් ලෙස අපි දේශිය ගොවියා රැක ගැනිමට මේ වන විට සාකච්ඡා ,සැලසුම් සකසමින් පවතින අතර බීජ අල නිෂ්පාදනයට මිලියන 100ක් අය වැය තුළින් අපි වෙන් කරලා තියෙනවා .මේ සඳහා ක්‍රමානුකූලව කටයුතු කල යුතු වෙනවා.

එවගේම මහරුෆ් මැතිතුමා නගරයේ ගැටළු පිළිබඳව මෙන්ම යතුරු පැදි ගාල් කිරිම සම්බන්ධව කතා කලා .මෙම ගැටළුව සඳහා සභාව ලෙස මැදිහත් වි කටයුතු කිරිමට යාමේදි අපට රථ ගාලක් හදන්න ස්ථානයක් නැති බැවින් එය කිරිමට නොහැකි වුණා.මේ සම්බන්ධයෙන් රථවාහන කමිටුවේ දි සාකච්ඡා කල අතර එහි දි මුලා සමාගම් වල යතුරු පැදි නගරයේ ගාල් කරලා තියෙනවා දක්නට ලැබුනා.ඔවුන් සමඟත් සාකච්ඡා කර මලාපවහන පද්ධතිය දැල් ගහලා වෙන් කරලා තියෙන ස්ථානයේ හා පොල භූමියේ වේල්ල අසල යතුරු පැදි ගාල් කිරිමට තීරණය කරනු ලැබුවා. ඒ වාගේම පදික වෙළඳ කුටි අවසානයේත් වාහන ගාල් කිරිමට ස්ථානයක් සැකසිමට මේ වන විට යෝජනා කරලා තියෙනවා.ඉදිරියේ දි මේ කටයුතු සිදු කරනවා.ව්‍යාපාරිකයින් විසින් නගරයේ වාහන නතර කිරිම පිළිබඳව මහාරුෆ් මැතිතුමා කතා කලා. එහි දි වාහන ගාල් කිරිමට විශේෂ අවසර දි තිබෙන්නේ ලාල් ෆාමසිය,ගොඩකුඹුර යන ආයතන වලට පමණයි.මේ ආයතන සමගද මෙම වාහන නතර කිරිම විධිමත් කරන අකාරය පිළිබඳව සාකච්ඡා කල අතර මේ සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් වුනා.එසේම ත්‍රිවිල් රථ ගාල් කිරිම පිළබඳව රථ සංගම් සමඟ සාකච්ඡා කලා.එහිදි ලියාපදිංචි ත්‍රිරෝද රථ වලින් වරකට ¼ ක් පමණක් ගාල් කිරිමට තීරණය කරනු ලැබුවා.මේ පිළිබඳව පොලිසිය දැනුවත් කල අතර අදාල දැන්වීම් පුවරුද ඉදිරියේදි සවි කිරිමට නියමිත ය.

තවද,ලියනගේ මැතිතුමා කැලි කසළ සම්බන්ධව අදහස් දැක්වුවා .මේ සඳහා අදාල ස්ථාන තුල කැලි කසළ බඳුන් ස්ථාපිත කිරිම යෝග්‍ය ය. එසේම ඩයරබා හන්දිය සඳහා ATM යන්ත්‍රයක් ලබා ගැනිම සම්බන්ධයෙන් මේවන විට බැංකුව සමඟ අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා.

ප්‍රභාත් මන්ත්‍රිතුමා යෞවන සමාජ පිළිබඳව මෙන්ම ළමුන්ගේ අධ්‍යාපනය පිළිබඳවත් අදහස් දැක්වුවා.

අජිත් ප්‍රේමලාල් මැතිතුමා පදික කඩ සම්බන්ධයෙන් කතා කලා .එහි දි ඉදිරියේදි එම කඩ ගිවිසුමගත විමේ කටයුතු සිදු කිරිමට අපේක්ෂිත ය. ෆායිස් මැතිතුමා පාසල් ළමුන්ට බස් රථ නවත්වන්නේ නැති බව සඳහන් කළා .මේ පිළිබඳව ලිඛිතව ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටින අතර එවිට අදාල මැදිහත්වීම් අපට සිදු කල හැකිය

එසේම, කුසුමාවති මන්ත්‍රීතුමිය ධනුෂ්ක මැතිතුමා ,දේශානි මන්ත්‍රිතුමියත් අදහස් පලකරනු ලබු අතර එම මන්ත්‍රිවරුන්හට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

එසේම, සිත්ති හුසෙයිමා මැතිණියගේ ඉල්ලිම් සංදේශ මඟින් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා,

සිසිර දිලාන් මැතිතුමා විසින් වැලිමඩ නගරයේ කසළ ගැටළුව , වාහන නවතා ගැනිමේ දි ගාස්තු අය කිරිම පිළිබඳව කතා කලා.මේ සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනිමට කටයුතු කරන අතර කමිටු වාර්තාවන්හි ප්‍රගතිය පිළිබඳව සඳහන් කරන ලෙසද ඉල්ලා සිටියා.එම ප්‍රගතිය ලබන කමිටුවල දි ඉදිරිපත් කිරිමට කටයුතු කරනවා.

හාසිම් මැතිතුමාගේ නාවෙල ග්‍රාම නිලධාරි මහතාගේ ගැටළුව යෝජනාවක් ලෙස ලබා දෙන්න .එවිට ප්‍රාදේශීය ලේකම් හා සාකච්ඡා කර පිළිතුරු ලබා දිය හැක.

තවද අබ්දුල් හසිජ් මැතිතුමා හා තුවාන් කාසිම් මන්ත්‍රිවරුන් විසින් ඔවුන්ගේ උත්සව සඳහා ගව මස් කැපිම සඳහා අය කරන ගාස්තුව අඩු කරන ලෙස පැවසුවද එය මේ අවුරුද්දේ ගැසට් එක අනුව එම අයකිරිම් සිදු කරනවා.ඒ අනුව ලබන වසරේ එම ගාස්තුව අඩු කිරිමට යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

තවද, මුත්තුකුමාර් මන්ත්‍රිතුමා වතුකරයේ ජනතාව සඳහා ගෙවල් සාදා දෙන ලෙස ඉල්ලා සිටි අතර අපේ ආණ්ඩුව විසින් ගෙවල් 4572 ක ලබා දිමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදු කරමින් පවතිනවා.

ඒවාගේම, දනිෂා මන්ත්‍රීතුමිය බස් ගැටළුව හා ගර්භනි මව්වරුන් පිළිබඳව කතා කලා.මෙහි ඔබිය බස් පිළිබඳ ගැටළුව ලිඛිතව ලබා දෙන්න. MOH ප්‍රශ්නය සඳහා සභාව ලෙස මැදිහත් වි කටයුතු කල හැකිය.

එසේම, සෝලා අක්‍රිය විම සම්බන්ධව චන්ද්‍රිකා මන්ත්‍රිතුමිය සඳහන් කලා ඒ පිළිබඳව ලිඛිතව ලබා දිමට කටයුතු කරන ලෙස හා ප්‍රජා ශාලාව පිළිබඳ ගැටළුව යෝජනාවක් ලෙස ඉදිරි සභාවට ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් පැමිණ සිටි සියලු දෙනාට ස්තූති කරමින් සහභාගී වූ සියලු මන්ත්‍රීවරුන්ටත් ,කාර්ය මණ්ඩලයටත්, ,ව්‍යාපාරික මහතුන්ටත්,මාධ්‍යවේදී මහතුන්හට හා උපකාර කළ සියලු දෙනාට ස්තූතිය පුද කර සිටින ලදි.මීළඟ සභාව 2025 අගෝස්තු මස 28 වන  දින පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.45 ට පමණ නිමා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ

\

මෙම සභා වාර්තාව ................................................ වන දින පැවති මහ සභාවේ දී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රිණී .....................................................................මැතිතුමා/මැතිණියගේ යෝජනාවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රිණී..................................................... මැතිතුමා/මැතිණියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/බහුතර ඡන්දයෙන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.